# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1992 අංක 20 දරන
# සමස්ත ලංකා තෙලගු සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 1992 මාර්තු මස 25 වන දින.]

**ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.**

---

1992 මාර්තු මස 27 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.**

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ගත හැකිය.

මිළ : ශත 60 යි. තැපැල් ගාස්තුව : රු. 1.00 යි.

## 1992 අංක 20 දරන සමස්ත ලංකා තෙළඟු සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1992 මාර්තු මස 25 වන දින]

එල්. ඩී.—ඕ. 68/90.

**සමස්ත ලංකා තෙළඟු සම්මේලනය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

"සමස්ත ලංකා තෙළඟු සම්මේලනය" යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන සම්මේලනයක්, එහි සාමාජිකයන් එකඟ වූ රීති අනුව, එකී සම්මේලනයට සම්බන්ධ සියලු පරමාර්ථ සහ කරුණු ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ හා ඉටු කරගැනීමේ කාර්යය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ පිහිටුවා තිබූ හෙයින් ද : පූර්විකාව.

එකී සම්මේලනය පිහිටුවනු ලැබූයේ යම් පරමාර්ථ හා කාරණා සඳහා ද ඒ පරමාර්ථ හා කාරණා එකී සම්මේලනය විසින් මෙතෙක් සාර්ථකව ක්‍රියාත්මක කර හා ඉටු කර ඇති හෙයින් සහ එකී සම්මේලනය සංස්ථාගත කරන ලෙස ඉල්ලුම් කර ඇති හෙයින් ද එකී ඉල්ලීමට ඉඩ දීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1992 අංක 20 දරන සමස්ත ලංකා තෙළඟු සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ සිට හා ඉන් පසු (මෙහි මින් මතු "සම්මේලනය" යනුවෙන් සඳහන් කරනු ලබන) සමස්ත ලංකා තෙළඟු සම්මේලනයේ දැනට සාමාජිකයන් ව සිටින තාක් තැනැත්තන් හෝ මෙයින් පිහිටුවනු ලබන සංස්ථාවෙහි සාමාජිකයන් වශයෙන් මින් මතු ඇතුළත් කරගනු ලබන තැනැත්තන් (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "සමස්ත ලංකා තෙළඟු සම්මේලනය" යන අභිධානය හා නාමය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් වන අතර ඒ නාමයෙන් එය විසින් ද එයට විරුද්ධව ද සියලු අධිකරණ වල නඩු පවරනු ලැබිය හැකි ය. තව ද පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද එය පාවිච්චි කිරීමේ ද ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය. සමස්ත ලංකා තෙළඟු සම්මේලනය සංස්ථාගත කිරීම.

3. සංස්ථාව පිහිටුවනු ලබන්නේ පහත දැක්වෙන පොදු පරමාර්ථ සඳහා බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:— සංස්ථාවේ පොදු පරමාර්ථ.

(අ) තෙළඟු ප්‍රජාවට අයත් සියලු සාමාජිකයන් එක්සත් කිරීම;

(ආ) ශ්‍රී ලංකාවේ සිටින තෙළඟු ජන කොට්ඨාසය සඳහා අරමුදලක් පිහිටුවීම සහ ඔවුන්ගේ දියුණුව සඳහා ඒ අරමුදල උපයෝගි කර ගැනීම;

(ඇ) ක්‍රීඩා, සංස්කෘතික සහ අධ්‍යාපන ක්ෂේත්‍රවල නිපුණත්වය හා දක්ෂතා තෙළුඟු තරුණයන් තුළ වැඩිදියුණු කර ගැනීමට අවස්ථා ලබා දෙන ක්‍රියාකාරකම් නංවාලීම හා වැඩි දියුණු කිරීම සහ උසස් අධ්‍යාපනය ලබා ගැනීම සඳහා අවස්ථා ඔවුන්ට සැලසීම;

(ඈ) තෙළුඟු භාෂාව ඉගෙන ගැනීමට අපේක්ෂා කරන තැනැත්තන් සඳහා අධ්‍යාපනික හා සංස්කෘතික ආයතන පිහිටුවීම සහ ඔවුන්ගේ දැනීම හා දක්ෂතා වැඩි දියුණු වන හා ප්‍රවර්ධනය වන ක්‍රියාකාරකම් ඇති කිරීම;

(ඉ) තෙළුඟු ජන සමාජයේ සාමාජිකයන්ට ලිවීමේ හා කියවීමේ හැකියාව ලබා ගැනීමේ අවස්ථා සලසා දීම සහ තෙළුඟු ජන සමාජයේ සාමාජිකයන් එදිනෙදා මුහුණපාන ප්‍රශ්න විසඳීමට උපකාර කිරීමේ අරමුණ ඇතිව නීති හා මූල්‍ය ආධාර ඔවුනට ලබා දීම;

(ඊ) තෙළුඟු ජන සමාජයේ සාමාජිකයන්ගේ අභිවෘද්ධිය සඳහා කටයුතු කිරීම සහ කුලය, පන්තිය හෝ ආගම නොසලකා සියලු තැනැත්තන් තුළ එක්සත්භාවය නංවාලීම; සහ

(උ) සංස්ථාවේ පරමාර්ථ ඉටු කර ගැනීමට ඉවහල් වන පරිදි සහ එහි ක්‍රියාකාරකම්, සම්බන්ධීකරණය කිරීම පිණිස ලේකම් කාර්යාලයක් පිහිටුවීම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

4. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත් ව, බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වාගෙන යාමේ සහ වසා දැමීමේ ද ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමේ සහ ලබා ගැනීමේ ද ප්‍රදානයන් සහ පරිත්‍යාග භාර ගැනීමේ හෝ එකතු කිරීමේ ද තම අරමුදල් ආයෝජනය කිරීමේ ද සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාවේ යෙදීමට අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් සේවයට බඳවා ගැනීමේ, සේවා නියුක්ත කිරීමේ හා අස් කිරීමේ ද බලය ඇතුළුව සංස්ථාවේ පරමාර්ථ සියල්ලම හෝ ඉන් කිසිවක් හෝ ඉටු කිරීමට හෝ සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය හෝ හිතකර සියලු කටයුතු, කාරණා හා දේවල් කිරීමේ, ඉටු කිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ බලය සංස්ථාට සතුවේ.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

5. (1) සංස්ථාවේ කටයුතු සංස්ථාවේ රීති මගින් විධිවිධාන සලස්වා ඇති පරිදි හා ඒ රීති අනුව තෝරා පත් කරගනු ලබන නිලධරයන්ගෙන් හා වෙනත් තැනැත්තන්ගෙන් සමන්විත විධායක කාරක සභාවක් විසින්, එකී රීතිවලට යටත් ව, පාරිපාලනය කරනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ ප්‍රථම විධායක කාරක සභාව මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේදී ධුර දරන සම්මේලනයේ විධායක කාරක සභාව විය යුතු ය.

සංස්ථාවේ රීති.

6. (1) සංස්ථාවේ විධායක කාරක සභාව සහ වෙනත් නිලධර යන් තෝරා පත් කර ගැනීම සඳහා වූ රීති ඇතුළුව සංස්ථාවේ පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය වන්නා වූ ද මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන්නා වූ ද යථා පරිදි කැඳවනු ලැබූ විධායක කාරක සභාවේ රැස්වීමක දී සාමාජිකයන්ගේ තුනෙන් දෙකක බහුතර ඡන්දයෙන් පූර්වයෙන් අනුමත කරන ලද්දා වූ ද රීති, සංස්ථාවේ සාමාජිකයන්ගේ සාමාන්‍ය මහා සභා රැස්වීමක දී හෝ විශේෂ මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් සෑදීම නීත්‍යනුකූල වන්නේය. එකී රීති සෑදී මෙන් පසුව එවැනිම රැස්වීමක දී ඒ ආකාරයෙන් ම ඒ රීති වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම කළ හැකි වන්නේ ය.

(2) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

සම්මේලනය විසින් ගෙවිය යුතු සහ ඊට අය විය යුතු ණය.

7. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේදී සම්මේලනයේ පැවති සියළු ණය හා බැරකම් සංස්ථාව විසින් ගෙවිය යුතු අතර එදිනට සම්මේලනයට අයවිය යුතු සියලු ණය හා ඊට ගෙවිය යුතු සියලු දායක මුදල් හා සම්මාදම් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාවේ මුදල් සහ දේපළ යෙදවීම.

8. අපේක්ෂා කරන කවර අවස්ථාවක දී වුවද, සංස්ථාවේ මුදල් සහ දේපළ, මෙහි සඳහන් කොට ඇති පරමාර්ථ ඉටු කර ගැනීම සඳහාම පමණක් යෙදවිය යුතු අතර, ඉන් කවර හෝ කොටසක්, කෙළින්ම හෝ අන්‍යාකාරයකින්, සංස්ථාවේ සාමාජිකයන්ට ලාභාංශ වශයෙන් හෝ ප්‍රසාද මුදල් වශයෙන් හෝ ලාභ වශයෙන් හෝ වෙනත් යම් ආකාරයකින් හෝ නොගෙවිය යුතු ය.

සංස්ථාව විසින් චංචල හෝ නිශ්චල දේපළ දැරිය හැකි බව.

9. යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක් හෝ අන්තිම කැමති පත්‍රයකින් දේපළ නියාදනය කිරීමක් ප්‍රකාර හෝ අන්‍යාකාරයකින් සංස්ථාව සතු වන යම් චංචල හෝ නිශ්චල දේපළක් භාර ගැනීමටත්, දැරීමටත්, නීත්‍යානුකූලව සංස්ථාවට බලය ඇත්තේය. තවද ඒ දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බද්දට දීමේ, කුලියට දීමේ, හුවමාරු කර ගැනීමේ හෝ අන්‍යාකාරයකින් නියාදනය කිරීමේ පූර්ණ බලය ඇතිව සංස්ථාව විසින් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවේ රීතිවලට යටත්ව එකී සියලු දේපළ දැරිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව තැබිය යුතු ආකාරය.

10. සංස්ථාවේ මුද්‍රාව, සංස්ථාවේ විධායක කාරක සභාවේ අනුමැතිය ඇතිව සහ, ලේකම්වරයා සහ විධායක කාරක සභාව විසින් තත්කාර්යය සඳහා බලය දෙනු ලැබූ විධායක කාරක සභාවේ සාමාජිකයකු ඉදිරිපිට දී මිස කිසිදු සාධන පත්‍රයකට නොතැබිය යුතු ය. ඔවුන් විසින් තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඒ සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතු අතර ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සනට පරිබාහිරව විය යුතු ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

11. මේ පනතේ සඳහන් තැනැත්තන් හා ඔවුන් වෙතින්, ඔවුන් මඟින් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන්නන්ගේ අයිතිවාසිකම්වලට හැර ශ්‍රී ලංකා ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය.

අනනුකූලතාවක් ඇතිවූ විට සිංහල භාෂා පාඨය බල පැවැත් විය යුතු බව.

12. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත් විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1.160 කි. කොළඹ 1. රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.